---

මහඔය ප්‍රාදේශිය සභාව
අම්පාර දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 නොවැම්බර් 21 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 ජුනි 02 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 පෙබරවාරි 21 දින සභාවේ සභාපතිතුමා වෙත යවන ලදි.

1.2 මතය

මාගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව මහඔය ප්‍රාදේශිය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට මහඔය ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්විම්

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2011 වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුම පිළියෙල කිරිමේ දී ආදායම රු. 222,265 ක් හා වියදම රු. 37,327 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම වූ රු. 62,950 ක මුදල වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ මුදල රු. 206,666 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර තිබුනේ රු. 156,395 ක් වූයෙන් උසාවි දඩ මුදල රු. 50,271 කින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

2013 අප්‍රේල් 11 දින වන විට විගණන විමසුම් 03 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම් වලට භාජනය වූ ගනුදෙනු වල ගණනය කළ හැකි වටිනාකම රු. 847,492 ක් විය.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 7,617,230 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ අදායම රු. 350,477 ක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ආදයම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 66,737 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 10,000 | 4,500 | - |
| (ii) | බදු කුලී | 2,445,100 | 2,147,904 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 287,000 | 293,670 | - |
| (iv) | සේවා සඳහා ගාස්තු | 1,250,000 | 1,422,791 | - |
| (v) | වරෙන්තු ගාස්තු හා දඩ මුදල් | 153,000 | 156,396 | - |
| (vi) | වෙනත් ආදායම් | 39,000 | 235,616 | 727,919 |

---

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු |
|---|---|---|
| | | ----- |
| (i) | උසාවි දඩ | 161,583 |
| (ii) | මුද්දර ගාස්තු | 62,950 |

3. පද්ධති හා පාලන

---

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය